අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

13 ශ්‍රේණිය	25 S I	ශ්‍රී ලංකා ඉතිහාසය	කාලය : පැය එකයි Time : one hour

ශ්‍රී ලංකා ඉතිහාසය ඇත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා.

විභාග අංකය.....

උපදෙස්

- මෙම ප්‍රශ්න පත්‍රය 1 හා 11 ලෙස කොටස් **දෙකකින්** සමන්විත වේ.
- **1 කොටස** 1-40 දක්වා ප්‍රශ්න **සියල්ලටම මෙම පත්‍රයේම ලබා දී ඇති උපදෙස්** පරිදි පිළිතුරු සපයන්න.
- **1 කොටසෙහි** නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු එක බැගින් හිමි වේ.
- කොටස් **දෙකටම** මුළු කාලය **පැය තුනකි.** පිළිතුරු ලියා අවසන් වූ පසු **1 කොටස 11 කොටසේ** පිළිතුරු පත්‍ර සමග **අමුණා භාර දෙන්න.**

- අංක 01 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග **නොගැලපේ.** එම **නොගැලපෙන** නම කුමක්දැයි හඳුනාගෙන එහි **අංකය වරහන** තුළ ලියන්න.

1	(1) අනුරාධපුර	(2) පොළොන්නරුව	(3) ගම්පොළ	
	(4) දඹදෙණිය	(5) යාපහුව		( )
2	(1) සදකඩපහණ	(2) මුරගල	(3) කොරවක්ගල	
	(4) වාහල්කඩ	(5) මූර්ති		( )
3	(1) සෙල්ලිපි	(2) රන්පත්	(3) තඹපත්	
	(4) පොත්පත්	(5) කුඩපත්		( )
4	(1) පාහියන්ගල	(2) අලිගල	(3) බටදොඹලෙන	
	(4) බෙලිලෙන	(5) අලවලලෙන		( )
5	(1) මහවිලච්චිය	(2) මනාකැටිය	(3) කවුඩුල්ල	
	(4) නොච්චිපොතාන	(5) හිරිවඩුන්න		( )
6	(1) කිත්ති	(2) මහාලාන කිත්ති	(3) ලෝකේශ්වර	
	(4) කේශධාතු කාශ්‍යප	(5) කිත්තිසේන		( )
7	(1) ශ්‍රී සෙංකණ්ඩශෛල පුර	(2) කටුපුළු නුවර	(3) ශ්‍රී වර්ධනපුර	
	(4) කන්දෙනුවර	(5) හස්ථිශෛලපුර		( )

Past Papers Wiki

8 (1) සමුගුදා කව (2) තෙරුවන්මාලා (3) මුතුකුමාරි කතාව
(4) වෙස්සන්තර ජාතකය (5) රාජසිංහ සිරිත ( )

9 (1) හෙන්ද්‍රික් බෙකර් (2) ජේම්ස් කැමල් (3) රොබට් විල්මට්
(4) එඩ්වඩ් බාන්ස් (5) කොලින් කැමල් ( )

10 (1) ඩි.බී. ජයතිලක (2) ටී.බී. ජයා (3) අතර් වී දියස්
(4) පියදාස සිරිසේන (5) අමදෝරිස් මෙන්ඩිස් ( )

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක් යුගලයක පද එකිනෙකට **නොගැලපේ.** එම **නොගැළපෙන** පද යුගලය හඳුනාගෙන ඊට අදාල **අංකය** ඉදිරියේ ඇති **වරහන තුළ** ලියන්න.

11 (1) මුටසීව රජතුමා - මහමේවුනා උයන කරවීම
(2) භාතිකාභය රජතුමා - රෝමයට දූතයන් යැවීම
(3) හතරවන කාශ්‍යප රජතුමා - දම්පියා අටුවා ගැටපදය
(4) මානවම්ම රජතුමා - පල්ලව ආධාර ලබා ගැනීම
(5) වෝහාරික තිස්ස රජතුමා - වෛතුල්‍යවාදය පැමිණීම ( )

12 (1) ඇමතිවරු - පරමාකන්ද ලිපිය
(2) භාණ්ඩාගාරික - මිහින්තලය ලිපිය
(3) ගණකවරු - මහඇලගමුව ලිපිය
(4) සෙන්පතිවරු - සිතුල්පව්ව ලිපිය
(5) උපරජවරු - ගොඩවාය ලිපිය ( )

13 (1) හොර්ටන්තැන්න - ඉහළ කදුකර තණ බිම්
(2) පොතාන - පහතරට තෙත් කලාපීය ලෙන්
(3) බණ්ඩාරවෙල - මධ්‍ය කඳුකරය ආශ්‍රිත විවෘත දඩයම් ස්ථාන
(4) බෙල්ලන්බැදිපැලැස්ස - පහතරට වියළි කලාපීය විවෘත ජනාවාස
(5) පල්ලෙමලල - වෙරළාශ්‍රිත විවෘත ජනාවාස ( )

14 (1) ඩඩ්ලි සේනානායක - හර්තාල් ව්‍යාපාරය
(2) ජෝන් කොතලාවල - කොළඹ සමුළුව
(3) එස්.ඩබ්ලිව් ආර්.ඩි. බණ්ඩාරනායක - නොබැඳි ප්‍රතිපත්තිය
(4) ඩි.එස්. සේනානායක - ගොවිජනපද ව්‍යාපාරය
(5) සිරිමාවෝ බණ්ඩාරනායක - එක්සත් ජාතීන්ගේ සමාජිකත්වය ( )

15 (1) ඩි. බී. ජයතිලක - ස්වදේශ කටයුතු
(2) ඩි.එස්. සේනානායක - කෘෂිකර්ම ඉඩම්
(3) එච්. එම්. මාකන් මාකර් - ගමනාගමන පොදු වැඩ
(4) ටී. බී. පානබොක්කේ - පාලාත් පාලන
(5) පී. සුන්දරම් - කම්කරු කර්මාන්ත ( )

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් **X** සහ **Y** තීරුවල දී ඇත. **Y** තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දිනවකවානු **X** තීරුවේ දී ඇති ඒවා සමග කිසියම් ආකාරයකට ගැලපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙලට **නොවේ**. .**Y** තීරුව **X** තීරුව සමග ගැලපෙන අනපිළිවෙල සකස් කළ විට පහත දී ඇති සංයෝග පහෙන් **එකක්** නිවරදිය. නිවරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන** තුළ ලියන්න.

16

X	Y
(1) බටකොට්ටේ	A මැදවච්චිය
(2) වලස්හේන	B අක්කරෙයිපත්තු
(3) මැදවත්ත	C වඩුක්කොඩෙයි
(4) සෝමපුර	D වාලච්චේනෙයි
(5) එගොඩපත්තුව	E සාම්පූර්

(1) BDEAC (2) CDAEB (3) CBDEA (4) AEDBC (5) DEBAC ( )

17

X	Y
(1) යසලාලක තිස්ස	A දෙවන ලම්භකරණ පෙළපතේ ආරම්භකයා
(2) වසභ රජතුමා	B දෙවන මෝරිය පෙළපතේ ආරම්භකයා
(3) ධාතුසේන රජතුමා	C තුන්වන ලම්භකරණ පෙළපතේ ආරම්භකයා
(4) ii උපතිස්ස රජතුමා	D පළමු මෝරිය පෙළපතේ අවසන් පාලකයා
(5) iii මුගලන් රජතුමා	E පළමු ලම්කරණ පෙළපතේ ආරම්භකයා

(1) BDEAC (2) CDAEB (3) CBDEA (4) AEDBC (5) DEBAC ( )

18

X	Y
(1) චන්ද්‍රභානු ආක්‍රමණය	A i සේන රජතුමා
(2) කාලිංගරායර හා චෝඩගංග	B i බුවනෙකබාහු රජතුමා
(3) iii කෘෂ්ණ රාෂ්ට්‍රකූට	C i පරාක්‍රමබාහු රජතුමා
(4) සය දමිළ ආක්‍රමණය	D iv මිහිඳු රජතුමා
(5) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ	E මිත්සෙන් රජතුමා

(1) BDEAC (2) CDAEB (3) CBDEA (4) AEDBC (5) DEBAC ( )

19

X	Y
(1) පන්නයෝ	A කුලීනයන්ගේ ඇදුම් පිරිසිදු කරන්නන්
(2) හාලි	B තණකොළ කපන්නෝ
(3) සලාගම	C කරනවැමියෝ
(4) රජක	D පේෂ කර්මාන්තයේ නිරත වූවන්
(5) ඇම්බැට්ටයෝ	E කුරුඳු තැලීම හා එකතු කරන්නන්

(1) BDEAC (2) CDAEB (3) CBDEA (4) AEDBC (5) DEBAC ( )

20

X	Y
(1) ස්ටුවට් මැකෙන්සි	A මුඩුබිම් පනත
(2) එඩ්වඩ් බාන්ස්	B උතුරු මැද පළාත පිහිටුවීම
(3) හෙන්රි වෝඩ්	C වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටු වීම
(4) විලියම් ග්‍රෙගරි	D කොළඹ මහනුවර දුම්රිය මාර්ගය
(5) වෙස්ට් රිච්වේ	E කොළඹ මහනුවර මාර්ගය

(1) BDEAC (2) CDAEB (3) CBDEA (4) AEDBC (5) DEBAC ( )

- අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකටම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතරින් **එකක් අදාල මාතෘකාවට නොගැලපේ.** එම නොගැලපෙන කරුණ තෝරා එහි **අංකය වරහන තුළ** ලියන්න.

21 හයවන පරාක්‍රමබාහු රජතුමා

(1) සමන්දේවාල ලිපිය මගින් තොරතුරු ලබාගත හැකිය
(2) පැරකුම්බා සිරිතට අනුය පියා ළමැණි ජයමහලැන
(3) යාපහුව යුගයේ ලංකාව ආක්‍රමණය කළ චෙන්-හෝ මොහුගේ පියා රැගෙන යාම
(4) ශ්‍රී රාමචන්ද්‍ර භාරතී මොහු පිළිබඳ සඳහන් කරයි
(5) මොහුව චිනයට රැගෙන ගොස් පසුව එවූ බව දියොගු කුතෝ සඳහන් කරයි ( )

22 යාපනය රාජධානිය

(1) 13 සියවසේ මැද භාගයේ ජාවක චන්ද්‍රභාණු මෙම ප්‍රදේශවල බලය පතුරා ඇත.
(2) පාණ්ඩ්‍යන් සිය නියෝජිතයා ලෙස චන්ද්‍රභාණුගේ පුතෙකු පත් කරයි
(3) පාණ්ඩ්‍ය බලය දුර්වල වූ විට ආර්ය චක්‍රවර්තීන් බලය පතුරා ඇත
(4) ඉබන් බතූතා ආර්ය චක්‍රවර්තී ලංකාවේ සුල්තාන්වරයා ලෙස හඳුන්වයි
(5) iv වික්‍රමබාහු රජ දවස ගම්පොළ රාජධානියේ ඇතැම් ප්‍රදේශවලින් බදු එකතු කර ඇත ( )

23 අනුරාධපුර රාජධානියේ පරිහානිය හා බිඳවැටීම

(1) අවසානභාගයේ රාජ්‍යත්වයට පත් වූ ඇතැම් පාලකයින් දුර්වල වීම
(2) කාලිංග හා පාණ්ඩ්‍ය පෙළපත් අතර බල අරගලයක් ඇති වීම
(3) චෝළ අධිරාජ්‍යයේ බල ව්‍යාප්තිය
(4) ආක්‍රමණිකයන් විසින් රාජ්‍ය භාණ්ඩාගාරය කොල්ල කෑම
(5) පළමුවැනි රාජ රාජ ලංකාව ආක්‍රමණය කිරීම ( )

24 පෘතුගීසි ආර්ථික ප්‍රතිපත්තිය

(1) කුළුබඩු ඇතුළු වෙළඳ ද්‍රව්‍ය ලබාගැනීම ප්‍රධාන ආර්ථික අරමුණ වීම
(2) අරාබි චීන මලබාර් වැනි වෙළඳුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම
(3) දේශපාලන අධිකාරිය විසින් ආර්ථික කටයුතු මෙහෙය වීම
(4) ස්වදේශිය සමාජ ආර්ථික සංස්ථා උපයෝගී කර ගැනීම
(5) අන්තර් ආසියාතික වෙළඳාමට සම්බන්ධ වීම ( )

25 මෝගන් කමිටුවේ අධ්‍යාපන යෝජනා

(1) අධ්‍යාපන පරිපාලනයට ප්‍රසිද්ධ ඉගැන්වීමේ දෙපාර්තමේන්තුව ඇති කිරීම

(2) අධ්‍යාපන කටයුතු පරිපාලනය රජයට පවරා ගැනීම

(3) ප්‍රාථමික අධ්‍යාපනය මව්බසින් ලබාදීමට කටයුතු කිරීම

(4) කොළඹ ඇකඩමිය නමින් ශිෂ්‍ය පුහුණු මධ්‍යස්ථානයක් ඇති කිරීම

(5) මිෂනාරි පාසල්වලට රජයේ අධාර ලබා දීම ( )

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති (A),(B),(C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ** නිවරදිය. නිවරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තොරන්න.

(A) සහ (B) පමණක් නිවරදි නම්..... **1** ද

(A) සහ (C) පමණක් නිවරදි නම්..... **2** ද

(B) සහ (C) පමණක් නිවරදි නම්..... **3** ද

(C) සහ (D) පමණක් නිවරදි නම්..... **4** ද

වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවරදි නම්..... **5 ද** වරහන් තුළ යොදන්න.

උපදේස් සම්පිණ්ඩනය				
1	**2**	3	4	5
A සහ B පමණක් නිවැරදිය	A සහ C පමණක් නිවැරදිය	B සහ C පමණක් නිවැරදිය	C සහ D පමණක් නිවැරදිය	**වෙනත් ප්‍රතිචාර** සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් හෝ නිවරදිය

26 පුර්ව ඓතිහාසික අවධිය පිළිබඳ පහත කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

A ක්‍රි.පූ. 5000 පසුව මෙම අවධියට මිනිසා යොමු වී ඇත

B ජනාවාස වියළි කලාපයේ ගංගා ආශ්‍රිතව මෙන්ම කඳුකර ප්‍රදේශවලද විය

C මානව ජන ඝනත්වය සෑම වර්ග ක්‍රි.මී. 10 ට එක් පුද්ගලයෙක් විය

D මීට වසර 13000 ට පෙර මානවයා කඳුකර ප්‍රදේශවල බාර්ලි වගා කර ඇත ( )

27 පළමුවෙනි සේන රජු සම්බන්ධයෙන් කවර ප්‍රකාශයක්/ප්‍රකාශ නිවැරදි වේද?

A මහින්ද කුමරු ඝාතනය කර රාජ්‍යත්වය තහවුරු කර ගැනීම

B ශ්‍රී මාර ශ්‍රී වල්ලභ පාණ්ඩ්‍ය ආක්‍රමණය එල්ල වීම

C වරගුණ වර්මන් හට ආධාරක සේනාංක ලබාදීම

D කුට්ඨා සෙනෙවියා යටතේ සේනාංක ඉන්දියාවට යැම ( )

28 ගම්පොළ රාජධානිය පිළිබඳ කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

A සේනාධිලංකාර සෙනෙවි ජයසිරි කුමරිය විවාහ කර ගැනීම

B v පරාක්‍රමබාහු දැදිගම කේන්ද්‍ර කර ගනිමින් රාජධානියක් පවත්වාගෙන යාම

C v පරාක්‍රමබාහු හා v බුවනෙකබාහු v විජයබාහුගේ පුතුන් වීම

D අලගත් කෝණාර ලංකාතිලක විහාරය ඉදිකිරීම ( )

29 ජාතික ව්‍යාපාරය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

A ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ලබාගැනීමට කටයුතු කිරීම

B ජාතික ඒකාග්‍රතාව ඇති කිරීම

C උද්ඝෝෂණ ව්‍යාපාර මෙහෙය වීම

D ආගමික හා සංස්කෘතික පුනරුදය ඇති කිරීම ( )

30 මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය සම්බන්ධයෙන් කවර ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේද?

A නිලනොලත් මන්ත්‍රී සංඛ්‍යාව බහුතරය වීම

B විධායක සභාවට නිලනොලත් තිදෙනෙකු පත් කිරීම

C පළාත්බද ඡන්ද කොට්ඨාස ක්‍රමය ඇති කිරීම

D බස්නාහිර පළාතට නව ද්විඩ මන්ත්‍රී ආසනයක් වෙන් කිරීම ( )

- අංක **31** සිට **35** දක්වා ප්‍රශ්නවලට නිවැරැදි පිළිතුර තෝරා එහි **අංකය** ඉදිරියෙන් ඇති **වරහන තුළ** ලියන්න.

31 සිංහල සංගය නමින් හැඳින් වූ කැරැල්ල ඇති වූයේ

(1) හයවැනි පරාක්‍රමබාහු රාජ්‍ය සමයේය (2) හයවැනි බුවනෙකබාහු රාජ්‍ය සමයේය

(3) අටවන වීර පරාක්‍රමබාහු රාජ්‍ය සමයේය (4) නමවැනි ධර්ම පරාක්‍රමබාහු රාජ්‍ය සමයේය

(5) හයවැනි විජයබාහු රාජ්‍ය සමයේය ( )

32 සද්ධර්මරත්නකාරය රචනා කරනු ලැබුවේ

(1) ධම්මඳින්න විමලකිත්ති හිමිය (2) රණස්ගල්ලේ හිමිය

(3) විදාගම මෛත්‍රීය හිමිය (4) වැත්තෑවේ හිමිය

(5) වේදේහ හිමිය ( )

33 විප්ලවකාරී සමසමාජ පක්ෂය නිර්මාණය කළේ

(1) එන්.එම්. පෙරේරා (2) එස්.ඒ. වික්‍රමසිංහ

(3) පිලිප් ගුණවර්ධන (4) කොල්වින් ආර් ද සිල්වා

(5) ඒ.ඊ. ගුණවර්ධන ( )

34 ශ්‍රී ලංකාවේ ප්‍රථම අග්‍රාණ්ඩුකාරයා වූයේ

(1) ශ්‍රීමත් ඔලිවර් ගුණතිලක (2) සෝල්බරි සාමි

(3) හෙන්රි මන්ක් මේසන් මුවර් (4) ඇන්ඩෘ කෝල්ඩිකොට්

(5) හිූ ක්ලිපර්ට් ( )

35 පුවක් එකතු කිරීම ආදි කටයුතු සංවිධානයට හා බදු අයකිරීමට පිහිට වූ දෙපාර්තමේන්තුව වූයේ

(1) කුරුවේ බද්ධ (2) මඩිහේ බද්ද

(3) මහ බද්ද (4) කොටිකා බද්ද

(5) කින්නර බද්ද ( )

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්න වලට අදාලව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්දයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොදින් ගැළපෙනුයේ පහත වගුවේ දැක්වෙන **1/ 2/ 3/ 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලයදැයි තෝරා ඊට අදාළ **අංකය වරහන තුළ** ලියන්න.

	පළමුවැනි ප්‍රකාශය	දෙවැනි ප්‍රකාශය
01	නිවැරදිය	වැරදිය
02	නිවැරදිය	නිවැරදිය
03	වැරදිය	වැරදිය
04	වැරදිය	නිවැරදිය
05	නිවැරදිය	නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදයි

	පළමුවැනි ප්‍රකාශය	**දෙවැනි ප්‍රකාශය**	
36	පෘතුගීසීන් පැමිණෙන විට යාපනය රාජ්‍ය ආර්ය චක්‍රවර්ති පරපුරේ පරරාජසේකරම් විසින් පාලනය කරනු ලැබීය.	ක්‍රි.ව. 1619 දී පිලිප් ද ඔලිවේරා යටතේ එල්ල කල ආක්‍රමණයෙන් දෙවන සංකිලි නෙරපා දමා යාපනයේ බලය තහවුරු කර ගනී.	( )
37	ඉංග්‍රීසි වෙළඳ සමාගම ඉන්දියාවේ මධුරාසි ප්‍රදේශය පාලනය සඳහා සැකසූ මධුරාසි පාලන ක්‍රමය මෙරට 1796 සිට 1798 දක්වා ක්‍රියාත්මක කරයි.	මධුරාසි පාලන ක්‍රමය යටතේ ආදායම් එකතු කිරීමට මධුරාසියෙන් ගෙන් වූ අවුම්ල්දාර්වරුන්ගේ සහයට කලෙක්ටර්වරු නමින් නිලධාරි පිරිසක් පත් කරන ලදී.	( )
38	කෝල්බෘක් ප්‍රතිසංස්කරණ වල ප්‍රතිපලයක් වශයෙන් පැරණි දේශීය ප්‍රභූ පන්තිය අබිබවා ධනය හා උගත්කම පදනම් කොටගත් නව ධනපති පංතියක් මෙරට තුළ ඇති විය.	ඩොනමෝර් කාරක සභාවල සාමාජික සංඛ්‍යාව උපරිම 9 ක් සහ අවම 6 ක් වූ අතර කාරක සභාවේ බහුතර කැමැත්තමත සභාපතිවරයා තෝරාගත් අතර ඔහු එම කාරක සභාවේ විෂය භාර අමාත්‍යවරයා විය	( )
39	1956-1965 කාල වකවානුව තුළ ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තිය තුළ කැපීපෙනෙන ලක්ෂණය වුයේ සීතල යුධ පසුබිම තුළ බ්‍රිතාන්‍ය සමග ඉතා කිට්ටු සම්බන්ධතාවකින් කටයුතු කිරීමය.	1965-1970 කාල වකවානුව තුළ මෙරට විදේශ ප්‍රතිපත්තිය තුළ හදුනාගත හැකි මුලික ලක්ෂණය වුයේ වෙනස් වන ලෝක බලතුලනය අනුව ලංකාව ජාත්‍යන්තර තලයට ගෙන ඒම සඳහා නොබැදි පිළිවෙතක් අනුගමනය කිරීමය.	( )
40	උතුරේ වගා කෙරුණු දුම්කොළ සුමාත්‍රා දිවයිනට අපනයනය කිරීමෙන් විශාල ආදායමක් විදේශවලට ඇදි ගිය බැවින් දුම්කොළ වෙළඳාම රජයේ ඒකාධිකාරයක් බවට පත් කිරීමට බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයා පියවර ගනී.	බ්‍රිතාන්‍යයන් වතු වගාව කෙරෙහි තම අවධානය යොමු කළ ද දේශීය කෘෂිකර්මාන්තය කෙරෙහි ප්‍රමාණවත් සැලකිල්ලක් නොදැක් වීම නිසා දේශීය කෘෂිකර්මාන්තය පරිහානියට පත් වූ අතර පීඩාවට පත් ගොවීන් 1848 ඉංග්‍රීසි විරෝධී සටන් ව්‍යාපාරයට එක් විය.	( )

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

13 ශ්‍රේණිය	25	S	II	ශ්‍රී ලංකා ඉතිහාසය	කාලය : පැය දෙකයි Time : 2 hours

ශ්‍රී ලංකා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1978 දක්වා.

උපදෙස්

- පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- 11 ප්‍රශ්නපත්‍රය A,B,C ලෙස කොටස ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- A කොටස ප්‍රශ්නය **අනිවාර්යය** වේ.
- B හා C කොටස්වලින් එක් කොටසකින් **අවම** වශයෙන් **එක් ප්‍රශ්නයක්වත්** තෝරාගෙන තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

A කොටස

1 ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

1 දැදුරු ඔය	2 නැගෙනහිර පළාත	3 ත්‍රිකුණාමලය
4 පරාක්‍රම සමුද්‍රය	5 පොළොන්නරුව	6 මහනුවර
7 කල්පිටිය	8 කතරගම	9 දඹදෙණිය
10 රයිගම	11 කරින්ද නදී	12 මන්නාරම

(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි)

B කොටස

2 පහත සඳහන් මාතෘකා යටතේ අනුරාධපුර යුගයේ අවසානය දක්වා ශ්‍රී ලංකා ඉතිහාසය ගොඩ නැගීමට සෙල්ලිපි දායකවන ආකාරය පරීක්ෂා කරන්න.

i දේශපාලන හා පරිපාලන තොරතුරු (ලකුණු 08 යි)

ii ආර්ථික තත්වය (ලකුණු 08 යි)

3 පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික යුගයෙන් වෙනස් වන ආකාරය පහත පහත සඳහන් තේමාවන් ඔස්සේ සාකච්ඡා කරන්න.

i නාක්ෂණය (ලකුණු 08 යි)

ii ජීවන රටාව සහ ආහාර රටාව (ලකුණු 08 යි)

PAST PAPERS WIKI

Past Papers Wiki

4 ලංකා ඉතිහාසය තුළ බිහි වූ විශිෂ්ට පාලකයෙක් ලෙස පළමුවැනි පරාක්‍රමබාහු රජතුමා හැඳින්විය හැකිය.

i පරාක්‍රමබාහු රජුගේ දෙමාපියන් නම් කරන්න. (ලකුණු 02 යි)

ii පරාක්‍රමබාහු රජු කරවූ වාරි කර්මාන්ත දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

iii පරාක්‍රමබාහු රජුගේ විශිෂ්ට වූ දේශපාලන ආර්ථික කාර්ය සාඵල්‍යතාව පරීක්ෂා කරන්න. (ලකුණු 12 යි)

5 පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත් ක මපිළිබඳ කෙටි සටහන් ලියන්න.

i මහාවංශය

ii දඹදෙණිය රාජධානිය

iii කෝට්ටේ යුගයේ අධ්‍යාපනය හා සාහිත්‍ය

iv රජරට ශිෂ්ටාචාරයේ පරිහානිය (ලකුණු 08 × 2 = 16 යි)

C කොටස

6 අවසන් දේශීය රාජධානිය වූ කන්ද උඩරට රාජධානිය දේශීය හා විදේශීය බලපෑම් වලින් නිදහස් කර ගත් විශිෂ්ට පාලකයෙක් ලෙස පළමුවැනි විමලධර්මසූරිය රජතුමා හැඳින් විය හැකිය.

i විමලධර්මසූරිය රජුගේ පියා නම් කරන්න. (ලකුණු 01 යි)

ii ඔහු බෞතීස්ම ලැබූ නාමය සඳහන් කරන්න. (ලකුණු 01 යි)

iii විමලධර්මසූරිය රජුට එරෙහිව පෘතුගීසි ආක්‍රමණ මෙහෙය වූ කපිතාන්වරු දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02 යි)

iv විමලධර්මසූරිය රජු අභියෝග ජය ගනිමින් ශක්තිමත් රාජ්‍යක් ගොඩ නැගූ ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 12 යි)

7 මෙරට මුහුදුබඩ ප්‍රදේශය තුළ ක්‍රියාත්මක වූ ලන්දේසි පාලනය පිළිබඳ තොරතුරු පහත සඳහන් අංශයන් ඔස්සේ ඉදිරිපත් කරන්න.

i ලන්දේසීන් මුහුදුබඩ ප්‍රදේශ තුළ බලය අල්ලා ගැනීම (ලකුණු 08 යි)

ii ලන්දේසි ආර්ථික ප්‍රතිපත්තිය (ලකුණු 08 යි)

8 1833 සිට මෙරට ක්‍රියාත්මක වූ කෝබෘන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යෝජනා මත මෙරට ආර්ථික සමාජ දේශපාලනික අංශයන් තුළ ඇති වූ වෙනස් කම් සැකවින් සාකච්ඡා කරන්න. (ලකුණු 16 යි)

9 පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම දෙකක ඓතිහාසික වැදගත් කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i නිදහසින් පසු ආර්ථික සංවර්ධනය


ii 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයේ ජනාධිපතිවරයා

iii 1848 නිදහස් සටන

iv බ්‍රිතාන්‍යයන් යටතේ වාණිජ බෝග වගාව (ලකුණු 08 × 2 = 16 යි)

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - පෙරහුරු පරීක්ෂණය 2026
General Certificate of Education (Advanced Level) Examination – Practice Test 2026

13 ශ්‍රේණිය	25 S II	ශ්‍රී ලංකා ඉතිහාසය	කාලය : Time :



WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank